# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2043/57 - 2017 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 9අ වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, 1987 මැයි මස 12 වැනි දිනැති අංක 453/10 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංස්ථාපනය කරන ලද අඹගමුව ප්‍රාදේශීය සභාව, මින්මතු දක්වෙන නව ප්‍රාදේශීය සභාවන් වන මස්කෙළිය ප්‍රාදේශීය සභාව, නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව සහ අඹගමුව ප්‍රාදේශීය සභාව යන ප්‍රාදේශීය සභාවන් සංස්ථාපනය කිරීම සඳහා 2018 පෙබරවාරි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.


1A - G 26539 — 32 (2017/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

"මස්කෙළිය ප්‍රාදේශීය සභාව"

4. මස්කෙළිය ප්‍රාදේශීය සභාව,

(i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයින් දස දෙනෙකුගෙන් ද ;
(ii) තෝරා යැවිය යුතු සභිකයන් හය දෙනෙකුගෙන් ද ;
(iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද ;

සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

ෆයිසර් මුස්තෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වැනි කොටස

අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාස වලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. - ග්‍රාම නිලධාරී කොට්ඨාස

(320 අයි) මාවුස්සාකැලේ, (320 එන්) බ්‍රවුන්ලෝ, (320 බී) සීතගඟුල, (320 එච්) මොකා, (320 එම්) බ්‍රවුන්ස්වික්, (320 ඒ) මස්කෙළිය, (320 සී) ගවරවිල, (320 කේ) මහනෙලු, (320 ජේ) ඕල්ටන් වත්ත, (320 ඩී) ස්ට්‍රෙතස්පි, (320 කිව්) මෝරෙ

ආ. - පළාත් පාලන ආයතන කොට්ඨාස

(14) මස්කෙළිය, (20) බ්‍රවුන්ලෝ, (21) සීතගඟුල, (22) මෝරෙ, (23) බ්‍රවුන්ස්වික්, (24) මාවුස්සාකැලේ, (25) මහනෙළු, (33) අප්කට්, (34) දේවකන්ද, (35) දඹේතැන්න

II වැනි කොටස

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා

| | |
|---|---|
| උතුරට | - අඹගමුව ප්‍රාදේශීය සභාව සහ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| නැගෙනහිරට | - නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| දකුණට | - රත්නපුර දිස්ත්‍රික්කය |
| බස්නාහිරට | - රත්නපුර දිස්ත්‍රික්කය සහ කෑගල්ල දිස්ත්‍රික්කය මායිම් වේ. |

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

"නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව"

4. නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව,

(i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයින් දොළොස් දෙනෙකුගෙන් ද ;
(ii) තෝරා යැවිය යුතු සභිකයන් අට දෙනෙකුගෙන් ද ;
(iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද ;

සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ ධූර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

ෆයිසර් මුස්තෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වැනි කොටස

අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. - ග්‍රාම නිලධාරි කොට්ඨාස

(319 එච්) ලෙතන්ටි, (319) දික්ඔය දකුණ කොටසක්, (319ඒ) දික්ඔය කොටසක්, (319 බී) හැටන් උතුර කොටසක්, (319 සී) හැටන් බටහිර කොටසක්, (319 ජේ) වනරාජ, (319 අයි) ඈන්ෆීල්ඩ්, (319 එච්) නවවැලිගම, (320) නෝර්වුඩ්, (320 එල්) වෙන්චර්, (319 ජී) කර්කස්වෝල්ඩ්, (319 එල්) ඉන්ජස්ට්‍රි, (319 එම්) ටිලරි, (319 එන්) බොගවාන, (319 ඕ) ලොයිනොන්, (319 එෆ්) බොගවන්තලාව, (319 පී) කොටියාගල,

ආ. - පළාත් පාලන ආයතන කොට්ඨාස

(15) සමරවැලි, (16) වනරාජ, (17) සලන්කන්ද, (18) නව වැලිගම, (19) නෝර්වුඩ්, (26) තැන්මදුරි, (27) ලෙච්චමී පහල, (28) පුලියවත්ත, (29) ලෙච්චමී ඉහල, (30) බොගවාන, (31) ලොයිනන්, (32) බොගවන්තලාව

II වැනි කොටස

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා.

| | |
|---|---|
| උතුරට | - අඹගමුව ප්‍රාදේශීය සභාව, හැටන් නගර සභාව සහ කොටගල ප්‍රාදේශීය සභාව. |
| නැගෙනහිරට | - ආගරපතන ප්‍රාදේශීය සභාව |
| දකුණට | - බදුල්ල දිස්ත්‍රික්කය සහ මස්කෙළිය ප්‍රාදේශීය සභාව |
| බස්නාහිරට | - මස්කෙළිය ප්‍රාදේශීය සභාව මායිම් වේ. |

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

**"අඹගමුව ප්‍රාදේශීය සභාව"**

4. අඹගමුව ප්‍රාදේශීය සභාව,

   (i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන් දහතුන් දෙනෙකුගෙන්ද ;
   (ii) තෝරා යැවිය යුතු සභිකයන් අට දෙනෙකුගෙන්ද ;
   (iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

   සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. අඹගමුව ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වැනි කොටස

අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ - ග්‍රාම නිලධාරී කොට්ඨාස

(314) අඹගමුව දකුණ, (314 ඒ) අඹගමුව නැගෙනහිර, (314 බී) අඹගමුව උතුර, (314 සී) සෙල්ලිපිගම, (314 ජී) හැබ්බෑකන්ද, (315 බී) සමන්සිරිගම, (316 ඒ) රම්පාදෙනිය, (316 බී) ගෝනවල, (316) බුලත්ගම, (316 සී) කලුගල, (316 ඩී) පිටවල,

(316 ඊ) මිල්ලගහමුල, (318) පොල්පිටිය, (318 ඒ) හිටිගම, (318 සී) මීනුවන්දෙනිය, (318 බී) හගරාපිටිය, (318 ඩී) ජම්බුතැන්න, (318 ඊ) කොත්තැල්ලෙන, (316 එෆ්) දගම්පිටිය, (316 ජී) කෙහෙල්වරාව, (317 සී) මොරහේන්ගම, (317) කිරිවන්එළිය, (317 ඒ) ලක්ෂපාන, (317 බී) වැගම, (314 ඩී) හෝමාගම, (314 ඊ) කලවල්දෙණිය, (315 සී) විදුලිපුර දකුණ, (315 ඩී) විදුලිපුර උතුර, (320 පී) වැලිඔය, (315) තීනියගල, (314 එෆ්) දෙහිගස්තැන්න, (315 ඒ) ගිනිගත්හේන, (320 එෆ්) වටවල, (320 ඊ) රොසැල්ල, (319 සී) හැටන් බටහිර කොටසක්, (320 ජී) රුවන්පුර, (320 ආර්) පැන්මූර්, (319) හැටන් දකුණ කොටසක්, (319 ඒ) හැටන් නැගෙනහිර කොටසක්, (319 බී) ෂැනන්

ආ - පළාත් පාලන ආයතන කොට්ඨාස

(1) සෙල්ලිපිගම, (2) රම්පදෙණිය, (3) කළුගල, (4) පොල්පිටිය, (5) ජම්බුතැන්න, (6) කෙහෙල්වරාව, (7) ලක්ෂපාන, (8) විදුලිපුර, (9) ගිනිගත්හේන, (10) වටවල, (11) රොසැල්ල, (12) රුවන්පුර, (13) සැනොන්

### *II වැනි කොටස*

අඹගමුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා.

| | |
|---|---|
| උතුරට | - මහනුවර දිස්ත්‍රික්කය. |
| නැගෙනහිරට | - මහනුවර දිස්ත්‍රික්කය, කොටගල ප්‍රාදේශීය සභාව සහ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| දකුණට | - නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව සහ මස්කෙළිය ප්‍රාදේශීය සභාව |
| බස්නාහිරට | - කෑගල්ල දිස්ත්‍රික්කය මායිම් වේ. |

11 - 887/1

---

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 9අ වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, 1987 මැයි මස 12 වැනි දිනැති අංක 453/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් සංස්ථාපනය කරන ලද නුවරඑළිය ප්‍රාදේශීය සභාව, මින්මතු දැක්වෙන නව ප්‍රාදේශීය සභාවන් වන ආගරපතන ප්‍රාදේශීය සභාව, කොටගල ප්‍රාදේශීය සභාව සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාව යන ප්‍රාදේශීය සභාවන් සංස්ථාපනය කිරීම සඳහා 2018 පෙබරවාරි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

"ආගරපතන ප්‍රාදේශීය සභාව"

4. ආගරපතන ප්‍රාදේශීය සභාව,

(i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන් නව දෙනෙකුගෙන්ද ;
(ii) තෝරා යැවිය යුතු සභිකයන් හය දෙනෙකුගෙන්ද ;
(iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද,

සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. ආගරපතන ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

ෆයිසර් මුස්තෆා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වැනි කොටස

නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. - ග්‍රාම නිලධාරි කොට්ඨාස

(475 ටී) එල්ඩර්න්හෝල්, (475 යූ) රහන්වත්ත, (475 එච්) නාගසේන, (475 වී) වෝල්ට්‍රිම් කොටසක්, (475 අයි) හෝල්බෲක්, (475 කිව්) බැල්මොරල්, (476 එන්) හෙන්ෆෝල්ඩ්, (476 පී) බ්‍රේමෝ, (476 එල්) ලිපකැලේ, (476 එම්) තන්ගකැලේ, (475 එල්) ඩයගම බටහිර, (475 එස්) ඩයගම නැගෙනහිර, (476 ආර්) සන්දිරිගම, (476 ටී) වැවර්ලි, (475 කේ) ආගරපතන, (476 ජේ) ග්ලාස්ගෝ, (475 ජේ) ඇලබද්ද, (476 කේ) ඇල්බියන්

ආ. - පළාත් පාලන ආයතන කොට්ඨාස

(24) රහන්වත්ත, (25) නාගසේන, (26) හෝල්බෲක්, (27) හෙන්ෆෝල්ඩ්, (28) තන්ගකැලේ, (30) ඩයගම, (31) වැවර්ලි, (32) ආගරපතන, (33) එලබැද්ද

II වැනි කොටස

ආගරපතන ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා.

| | |
|---|---|
| උතුරට | - කොටගල ප්‍රාදේශීය සභාව |
| නැගෙනහිර | - නුවරඑළිය ප්‍රාදේශීය සභාව |
| දකුණට | - නුවරඑළිය ප්‍රාදේශීය සභාව සහ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| බස්නාහිරට | - නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව මායිම් වේ. |

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

**"කොටගල ප්‍රාදේශීය සභාව"**

4. කොටගල ප්‍රාදේශීය සභාව.

   (i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන් දස දෙනෙකුගෙන්ද ;
   (ii) තෝරා යැවිය යුතු සභිකයන් හය දෙනෙකුගෙන්ද ;
   (iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද ;

   සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. කොටගල ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

**ෆයිසර් මුස්තාෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වැනි කොටස

නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. - ග්‍රාම නිලධාරී කොට්ඨාස

(475 එස්) හෝලිරූඩ් කොටසක්, (475 ඉසෙඩ්) ග්‍රේට් වෙස්ටර්න්, (475 ඩී) වටගොඩ කොටසක්, (475 එෆ්) ලිඳුල, (475 ජී) රත්නගිරිය කොටසක්, (475 එක්ස්) බෙයාවෙල් කොටසක්, (475 ඊ) තලවකැලේ කොටසක්, (475 ආර්) කුම්බ්වුඩ් කොටසක්, (475 සී) ඩෙවෝන්, (475 එන්) ඩේ්‍රටෝන්, (475 බී) දිඹුල, (475 පී) බෝගහවත්ත, (475 කිව්) මවුන්ට් වර්නෝන්, (475) කොටගල, (475 එම්) ස්ටොනි ක්ලිෆ්, (475 ඒ) කුඩාඔය, (475 වයි) ඉයුෆීල්ඩ්

ආ. - පළාත් පාලන ආයතන කොට්ඨාස

(6) ග්‍රේට් වෙස්ටර්න්, (7) වටගොඩ, (8) රත්නගිරිය, (17) කුම්බ්වුඩ්, (18) ඩෙවෝන්, (19) දිඹුල, (20) බෝගහවත්ත, (21) කොටගල, (22) කුඩාඔය, (23) ඉයුෆීල්ඩ්

II වැනි කොටස

කොටගල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :

| | |
|---|---|
| උතුරට | - තිස්පනේ ප්‍රාදේශීය සභාව සහ කොත්මලේ ප්‍රාදේශීය සභාව |
| නැගෙනහිරට | - නුවරඑළිය ප්‍රාදේශීය සභාව සහ අඹගමුව ප්‍රාදේශීය සභාව |
| දකුණට | - ආගරපතන ප්‍රාදේශීය සභාව සහ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| බස්නාහිරට | - අඹගමුව ප්‍රාදේශීය සභාව සහ මහනුවර දිස්ත්‍රික්කය මායිම් වේ. |

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මෙම නියමයෙන්,

1. මෙහි උපලේඛනයේ I වන කොටසෙන් නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා එම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ 1 වන ඡේදය යටතේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.

**"නුවරඑළිය ප්‍රාදේශීය සභාව"**

4. නුවරඑළිය ප්‍රාදේශීය සභාව,

   (i) තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන් දහහතර දෙනෙකුගෙන් ද ;
   (ii) තෝරා යැවිය යුතු සභිකයන් නව දෙනෙකුගෙන් ද ;
   (iii) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද ;

   සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි.

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

I වැනි කොටස

නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත 'අ' ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය සහ 'ආ' ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. - ග්‍රාම නිලධාරී කොට්ඨාස

(534) කඳපොල, (534 එෆ්) කොන්කෝඩියා, (534 ජී) පාර්ක්, (534 සී) කඳපොළ මධ්‍යම, (534 ඒ) ගල්පාලම, (534 බී) ජයලංකා, (534 ඩී) කඳපොළ නැගෙනහිර, (334 එච්) පීඩෲ, (535 ජී) හාවාඑළිය උතුර කොටසක්, (535 එච්) හාවාඑළිය

නැගෙනහිර කොටසක්, (535 අයි) බුලුඇල කොටසක්, (535) නුවරඑළිය කොටසක්, (535 එෆ්) හාවාඑළිය බටහිර කොටසක්, (535 ජේ) ටොපෑස්, (535 කේ) බඹර කැලේ කොටසක්, (535 එල්) නුවරඑළිය බටහිර කොටසක්, (535 එම්) ශාන්තිපුර, (535 එන්) කලාපුර කොටසක්, (476) නානුඔය, (476 සී) බංගලාහත, (476 ඊ) වින්දිකෝනර්, (476 එෆ්) මාගොඩ, (476 ඩී) රුවන්එළිය, (535 ඒ) මාගස්තොට කොටසක්, (478) ගොරඩිහෙල, (478 ඒ) සීතාඑළිය කොටසක්, (535 ඊ) සඳතැන්න කොටසක්, (476 ජී) මිහිඳුපුර, (476 එච්) මීපිලිමාන, (476 බී) පැරකුම්පුර, (475 ඩබ්ලිව්) සමර්සෙට්, (476 ඒ) කිරිමැටිය, (475 වී) වෝල්ට්‍රින් කොටසක්, (477) පට්ටිපොල, (477 ඒ) අඹේවෙල.

ආ. - පළාත් පාලන ආයතන කොට්ඨාස

(1) කඳපොල, (2) පාර්ක්, (3) ගල්පාලම, (4) පීඩෲ, (5) ශාන්තිපුර, (9) නානුඔය, (10) මාගොඩ, (11) රුවන්එළිය, (12) සීතාඑළිය, (13) මීපිලිමාන, (14) පැරකුම්පුර, (15) කිරිමැටිය, (16) වෝල්ට්‍රින්, (29) අඹේවෙල.

## II කොටස

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා.

| | |
|---|---|
| උතුරට | - කොත්මලේ ප්‍රාදේශීය සභාව සහ හගුරන්කෙත ප්‍රාදේශීය සභාව |
| නැගෙනහිර | - රාගල ප්‍රාදේශීය සභාව සහ බදුල්ල දිස්ත්‍රික්කය |
| දකුණට | - බදුල්ල දිස්ත්‍රික්කය |
| බස්නාහිරට | - ආගරපතන ප්‍රාදේශීය සභාව සහ කොටගල ප්‍රාදේශීය සභාව මායිම් වේ. |

11 - 887/2

---

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තඵා වන මම, 2016 දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 1998/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද තමන්කඩුව ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමට අදාළ නියමය එහි සඳහන් කර ඇති 2017 ජුනි මස 30 වැනි දිනය වෙනුවට 2018 පෙබරවාරි මස 14 වැනි දිනය ආදේශ කරමින් සංශෝධනය කරමි.

**ෆයිසර් මුස්තඵා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

## මහා නගර සභා ආඥපනත

### නියමය

(252 අධිකාරය වූ) මහා නගර සභා ආඥපනතේ 2, 3, 5, සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙම නියමයෙන්, මින් පෙර මවිසින් 2016 දෙසැම්බර් මස 19 වැනි දින 1998/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පොළොන්නරුව මහා නගර සභාව සංස්ථාපනයට අදාළ නියමය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරමි.

1. එහි (1) වැනි වගන්තියෙන් ප්‍රකාශයට පත්කරන ලද උපලේඛනයේ 1 වැනි කොටස වෙනුවට මෙහි පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් ;

"I වැනි කොටස

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය

අ. ග්‍රාම නිලධාරි කොට්ඨාස

(153) බැඳිවැව, (155) ඇතුමල්පිටිය, (155ඒ) සිරිසඟබෝ පෙදෙස, (162) වීර පෙදෙස, (163) පුලතිසි පෙදෙස, (167) පොත්ගුල් පෙදෙස, (168) උඩවෙළ, (169) මහවැලි පෙදෙස, (170) නිශ්ශංකමල්ල පෙදෙස, (171) තෝපාවැව, (172) පොළොන්නරුව නගරය, (178) ගල්තබරාව, (179) කුරුප්පු හන්දිය, (180) මහසෙන් පෙදෙස, (183) කඳුරුවෙල බටහිර, (185) පැරකුම් පෙදෙස, (186) කඳුරුවෙල නැගෙනහිර, (188) කඳුරුවෙල දකුණ.

ආ. පළාත් පාලන ආයතන කොට්ඨාස

(6) බැඳිවැව, (7) පොළොන්නරුව, (9) පොත්ගුල් පෙදෙස, (10) මහවැලි පෙදෙස, (11) කඳුරුවෙල.

2. එහි 4 වැනි වගන්ති වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීමෙන් ;

"(4) පොළොන්නරුව මහා නගර සභාව

(i) (252 වැනි අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කර ගත යුතු සභිකයින් හය දෙනෙකුගෙන් ද ;
(ii) (252 වැනි අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා ගත යුතු සභිකයින් හතර දෙනෙකුගෙන් ද ;
(iii) (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද සමන්විත විය යුතු ය."

3. එහි 5 වැනි වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් ;

"(5) මෙම මහා නගර සභාවේ ධුර කාලය 2018 පෙබරවාරි මස 15 වැනි දින සිට ආරම්භ විය යුතුය."

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4, 5, 6 සහ 9අ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා වන මම, මින් පෙර මවිසින් 2016 දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 1998/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පොළොන්නරුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරමි.

1. එහි උපලේඛනයේ I වැනි කොටස වෙනුවට මෙහි පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන්,

"I කොටස

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත "අ" ඡේදයේ සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ "ආ" ඡේදයේ සඳහන් පළාත් පාලන ආයතන කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය.

අ. ග්‍රාම නිලධාරි කොට්ඨාස

(154) සමුද්‍රගම, (156) නිකවැව, (157) සිංහ උදගම, (158) කඩවල වැව, (159) නැගෙනහිර අලුත්වැව, (160) බටහිර අලුත් වැව, (161) ගනන්ගොල්ල, (164) පරාක්‍රම සමුද්‍රය, (165) අඹන්ගග, (166) කළහගල, (173) පලුගස්දමන 01 ඇල, (174) පලුගස්දමන 02 ඇල, (175) පලුගස්දමන 03 ඇල, (176) පලුගස්දමන උතුර, (177) පලුගස්දමන දකුණ, (181) මනික්කාම්පට්ටිය, (182) නෙලුම්විල, (187) ගල්ලැල්ල, (188) ගල්ලැල්ල බටහිර, (189) කොටලීය, (190) කාලිංග ඇල, (191) දමන ගැමුනුපුර, (192) දිවුලාන, (193) පුදූර්, (194) සිංහරාජපුර, (195) ඕනෑගම, (196) විජයරාජපුර, (197) මැදමලුව, (198) ලක්ෂ උයන, (199) නිශ්ශංක මල්ලපුර, (200) සේවා ගම, (201) වැවේ තැන්න, (202) මොනරතැන්න, (203) විජයබාහුපුර, (204) සිංහපුර, (205) උණගලවෙහෙර දකුණ, (206) ශාන්තිපුර.

ආ. පළාත් පාලන ආයතන කොට්ඨාස

(1) විජයබාපුර, (2) හේවාගම, (3) විජයරාජපුර, (4) මැදමළුව, (5) කඩවලවැව, (8) පලුගස්දමන, (12) අලුත්වැව, (13) ගල්ලැල්ල, (14) කලහගල.

2. එහි 4 වැනි වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් ;

"(4) පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කර ගත යුතු සභිකයින් දහ දෙනෙකුගෙන් ද ;
(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා පත්කර ගත යුතු සභිකයින් හය දෙනෙකුගෙන් ද ;
(iii) (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින් ද සමන්විත විය යුතු ය."

3. එහි 5 වැනි වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් ;

"(5) පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2018 පෙබරවාරි මස 15 වැනි දිනය වශයෙන් නියම කරමි."

**ෆයිසර් මුස්තෆා,**
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

11 - 887/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.